135

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.03.31 |


**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 04-2017**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>අධිවේගී මාර්ගවල ගමන් කිරීම වෙනුවෙන් ගෙවූ ප්‍රවේශපත්‍ර ගාස්තු ප්‍රතිපූරණය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2017 හා 2017.02.17 දිනැති ලිපිය හා බැඳේ. (එහි පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8 හා 2017.03.16 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.එම චක්‍රලේඛයේ සඳහන් පරිදි සාමාන්‍ය දෛනික රාජකාරී නොවන විශේෂිත රාජකාරී සඳහා නිලධරයෙකු අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගේ හෝ ගණන් දීමේ නිලධරයාගේ පූර්ව අනුමැතිය ඇතිව අධිවේගී මාර්ගය භාවිතා කළ අවස්ථාවකදී ඒ සඳහා භාවිත කළ වාහනය වෙනුවෙන් ගෙවූ ප්‍රවේශ ගාස්තුව හෝ සුඛෝපභෝගී බස් රථයක ගමන් කළ අවස්ථාවකදී ඒ සඳහා වැය කළ ප්‍රවේශ පත්‍ර ගාස්තුව ප්‍රතිපූරණය කළ හැක.

04.අධිවේගී මාර්ග භාවිත කිරීමෙන් සාමාන්‍ය මාර්ග භාවිත කිරීමේදී රජයට දැරීමට සිදුවන පිරිවැයට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදු නොවන බවට පෞද්ගලිකව සෑහීමකට පත්වීමෙන් පසු නිලධරයෙකුට අධිවේගී මාර්ගය භාවිත කර රාජකාරී සඳහා යාමට පූර්ව අනුමැතිය දීම අදාළ බලධරයන්ගේ වගකීමක් බව වැඩිදුරටත් එහි සඳහන් වේ.

05.මෙම චක්‍රලේකයේ සඳහන් විධිවිධාන මෙම උපදෙස් ලිපිය නිකුත් කරන දින සිට ක්‍රියාත්මක වේ.

06.2017 වර්ෂයේදී සියලුම ආයතන තම ප්‍රතිපාදන සීමාව තුළ මේ සඳහා වැයවන වියදම් කළමනාකරණය කරගත යුතු අතර මේ වෙනුවෙන් පළාත් භාණ්ඩාගාරය වෙතින් අමතර ප්‍රතිපාදන ඉල්ලා නොසිටිය යුතුය.


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 2234052<br>091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

මෙම චක්‍රලේඛ උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) : දැ.ගැ.ස.
03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.
04. ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් : දැ.ගැ.ස.

(133)

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2017

මගේ අංකය : EST/6/06/TVL/3010
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.02.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## අධිවේගී මාර්ගවල ගමන් කිරීම වෙනුවෙන් ගෙවූ ප්‍රවේශපත්‍ර ගාස්තු ප්‍රතිපූරණය කිරීම

සාමාන්‍ය දෛනික රාජකාරී නොවන විශේෂිත රාජකාරී සඳහා නිලධරයෙකු අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගේ හෝ ගණන් දීමේ නිලධරයාගේ පූර්ව අනුමතිය ඇතිව අධිවේගී මාර්ගය භාවිත කළ අවස්ථාවක දී ඒ සඳහා භාවිත කළ වාහනය වෙනුවෙන් ගෙවූ ප්‍රවේශ ගාස්තුව හෝ සුඛෝපභෝගී බස් රථයක ගමන් කළ අවස්ථාවක දී ඒ සඳහා වැය කළ ප්‍රවේශ පත්‍ර ගාස්තුව ප්‍රතිපූරණය කළ හැක.

02. අධිවේගී මාර්ග භාවිත කිරීමෙන් සාමාන්‍ය මාර්ග භාවිත කිරීමේ දී රජයට දැරීමට සිදුවන පිරිවැයට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදු නොවන බවට පෞද්ගලිකව සෑහීමකට පත්වීමෙන් පසු නිලධරයෙකුට අධිවේගී මාර්ගය භාවිත කර රාජකාරී සඳහා යාමට පූර්ව අනුමතිය දීම අදාළ බලධරයන්ගේ වගකීමකි.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2017.01.01 දින සිට ක්‍රියාත්මක වේ. 2017 වර්ෂයේ දී සියලුම ආයතන තම ප්‍රතිපාදන සීමාව තුළ මේ සඳහා වැයවන වියදම් කළමනාකරණය කරගත යුතු අතර මේ වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙතින් අමතර ප්‍රතිපාදන ඉල්ලා නොසිටිය යුතුය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය